**පුත්තලම ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පුත්තලම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2022 වර්ෂයේ සභික දීමනා රු.345,000ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැනීම හේතුවෙන් ආදායම වැඩිපුර සටහන් කර තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට ගොනුව | | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) | මු.රෙ 104 (1) (3) (4) | 2022 වර්ෂයේදී අස්ථානගත වූ මුන්දලම පුස්තකාලයේ පරිගණක යන්ත්‍රයට අදාලව මු. රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. . | පරීක්ෂණයක් සිදු වෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) | මු.රෙ 571(2) | වටිනාකම රු.692,356ක් වූ තැන්පත් 54ක් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිදහස් කර නොගන්නා තැන්පතු නිත්‍යානුකූලව සහා අරමුදලට බැර කරගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මු.රෙ 1647 (අ), (ආ) හා (ඇ) | වාහනයේ උපකරණ හා අමතර උපකරණවල ආරක්ෂාව සම්බන්ධයෙන් වෙනසක් කරන අවස්ථාවන්හිදී ලොග් සටහන් පොතෙහි ලියා නොතිබූ අතරම උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. තවද වාහනයට අදාළව පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනයක් නඩත්තු කරද නොතිබුණි. | ලොග් පොත් යාවත්කලීනව පවත්වා ගන්නා ලෙසටත් සමීක්ෂණයක් සිදු කරන ලෙසටත් පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනයක් නඩත්තු කරන ලෙසටත් උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 128 වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් පරිහරණය කරනු ලබන දේපළ 142ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 5(3) හා 5(6) රීතිය | ආදායම් එක් රැස්කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබූ අතර අයවිය යුතු සියළු ආදායම් හා වෙනත් ගාස්තු රැස්කර නොතිබුණි. | ඉදිරියේදී එය විධිමත්ව හා ජංගම වැඩ සටහන් පවත්වා අය කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,731,639ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 37,503,587ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 3,736 | 3,150 | 2,254 | 2,582 | 3,536 | 3,267 | 2,693 | 2,394 |
| කුලී | 18,800 | 18,016 | 13,348 | 9,494 | 17,800 | 18,874 | 14,091 | 6,136 |
| බලපත්‍ර ගාස්තු | 2,855 | 1,997 | 1,997 | - | 2,901 | 1,663 | 1,663 | - |
| වෙනත් ආදායම් | 22,995 | 6,099 | 6,099 | - | 3,050 | 1,802 | 1,802 | - |
| එකතුව | 48,386 | 29,262 | 23,698 | 12,076 | 27,287 | 25,606 | 20,249 | 8,530 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ, වරිපනම් රු.1,682,457ක්, අක්කර බදු රු.899,317ක් සහ කුලී රු.9,494,287ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.26,016,708ක් හා සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු රු.39,657,497ක් විය. | සභාව වෙත 2022 වර්ෂයේ හා 2023 වර්ෂයට අදාල ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගානීම සඳහා අදාල ආයතන වෙත ලිඛිත සිහි කැඳවීම් කර ඇති බව. | හිග උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කර්මාන්ත හිමියන් 144 දෙනෙකුගේ පරිසර බලපත්‍රවල වලංගු කාලය 2023 සැප්තැම්බර් 30 වන විට ඉකුත් වී තිබූ අතර නව බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභාවට රු.180,000ක ආදායමක් අහිමිව තිබුණි. | ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය 21 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/ බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයෙහි පොදු නියම හා කොන්දේසි 01 අනුව බලපත්‍රය වලංගු කාලය අවසන්වීමට මසකට පළමුව බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කළ යුතු බවට දක්වා ඇතත් එසේ සිදුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර අලුත් කිරීමට යොමු කරන බව. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රයෙහි පොදු නියම හා කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වැඩබලන ආදායම් පරීක්ෂකවරයෙකු භාරයේ තිබූ අංක 288 දරන උප කුවිතාන්සි පොත අස්ථානගත වීම හේතුවෙන් එහි අංක 14357 සිට 14400 දක්වා ලදුපත්වලින් කිසිදු මුදලක් සභාවට අය වී නොතිබුණි. තවද 2022 දෙසැම්බර් මාසයේ දී නැවතත් ඔහු වෙත ලදු පොතක් භාර දී තිබූ අතර එම පොතේ 12738 ලදුපතෙහි අවසන් පිටපත හා 12739 ලදුපතෙහි මුල් පිටපත අස්ථානගත වී තිබීම සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් නොපවත්වා නැවත ආදායම් රැස් කිරීමේ කටයුතු පවරා තිබුණි. | කුවිතාන්සි ලදු පොත නැවත ඔහුගෙන් ලබාගෙන හිඟ මුදල අය කර ගැනීම සඳහා මෙම නිලධාරියා අදාල සේවයේ පිහිටුවා ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අයිතම් 43කට අදාළ භාණ්ඩ ඒකක 221ක් ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.30,233,353ක් වූ අතර එය තුල වර්ෂ 05ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.21,134,729ක් විය. | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.10,687,453ක් විය. | සොයා බලා ගෙවීම් සිදු කරන බව. | ණය හිමියන් කඩිනමින් පියවීමට කටයුතු කල යුතුය |

### 3.2 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | නව වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර බදු දීම සඳහා වූ බදු ගිවිසුම අනුව අතුරු බදුදීම හේතුවෙන් ගිවිසුම අවලංගු කළ හැකි වුවත් එහි කඩ අංක 03 හා 04 බදුකරු විසින් අතුරු බදු දී තිබුණි. | ඉදිරියේදී ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තොඩුවාව පාරෙහි කඩ බදු දීම සඳහා වූ බදු ගිවිසුමෙහි 07 වන වගන්තිය ප්‍රකාරව අදාළ ගිවිසුම අවසන් කිරීමට පළමු පාර්ශවයට බලය ඇති බව දෙවන පාර්ශවය පිළිගනී යනුවෙන් දක්වා ඇතත් කොළඹ | පළාත් පාලන කොමසාරිස්තුමා ගෙන් උපදෙස් ලද වහාම ඒ අනුව කටයුතු කරන බව. | කඩිනමින් ගිවිසුම්ගතවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාරෙහි ඇති කඩ අංක 48 සිට 54 දක්වා කඩ 07ක් 2022 ජනවාරි සිටද තොඩුවාව පාරෙහි කඩ අංක 20 සිට 39 දක්වා කඩ 20ක් 2022 අප්‍රේල් සිටද කඩ කුලී නොගෙවන අතර ගිවිසුම්ගත වීමකින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. | | |
| (ඇ) | තොඩුවාව පාර අංක 17 දරන කඩ කාමරය 1998 ඔක්තෝබර් මස 07 වන දින වසර 04ක කාලයක් සඳහා කුලී පදනම මත ලබා දී තිබූ අතර 2002 වර්ෂයේ ඇති වූ ආරවුලක් මත බදුකරු විසින් සභාවට විරුද්ධව නඩුවක් පවරා තිබුණි. අදාළ නඩු දිනයේදී ප්‍රාදේශීය සභා නියෝජිතයෙකු සම්බන්ධ නොවීම මත සභාවට අවාසිදායක වන අයුරින් තීන්දුව ලබා දී තිබුණි. මෙම බදුකරු මේ වන විට කඩ කාමරයේ අවසරයකින් තොරව රැඳී සිටින අතර 2021 දෙසැම්බර් 31 දින වන විට රු.54,021ක මුදලක් ගෙවිය යුතුව තිබුණි. නැවතත් සභාව විසින් සිවිල් නඩුවක් පැවරීම සඳහා රු.150,000ක මුදලක්ද වැයකර තිබුණි. | සියලු ලිපි ලේඛනද නීතිඥ මහතා වෙත ලබා දී ඇති බව. | හිඟ බදු මුදල් අයකර ගැනීමට හෝ අදාළ කටයුතු කිරීම කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 138ක් පැවැති අතර ඒ තුල සති පොළවල්, පුස්තකාල, පෙර පාසල්, පොදු නල ළිං, සුසාන භූමි හා ක්‍රීඩා භූමිද විය. පවරා නොගත් දේපළවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සිදු කෙරෙමින් පැවතුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.894,106ක මුදලක් සභාව විසින් දරා තිබුණි. | පවරා ගැනීම සඳහා අදාළ ආයතන වෙත ඉල්ලීම් කර ඇති බව. | කඩිනමින් වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ද්වීතියික තනතුරු 06ක්ද ප්‍රාථමික තනතුරු 10ක්ද පුරප්පාඩු වී තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා අදාල ආයතන වලට ඉල්ලීම් කර ඇති බව. | සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව නිවැරදිව හඳුනාගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පසුගිය වර්ෂවලදී සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 14 දෙනෙකුගෙන් එකතුව රු.183,756ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | අයවිය යුතු මුදල් සඳහා සේවකයින් වෙත සිහි කැඳවීම් ලිපි යවා ඇති බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සභාව සතු ට්‍රැක්ටරයක් සහ ටේලරයක් වසර 04කට වඩා වැඩි කාලයක සිට අළුත්වැඩියා සිදු කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් පැවතුණි. | සමීක්ෂණ තීරණවලට අනුව අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බව. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 11ක් ඉටු කිරීම සඳහා රු.658,575ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | මෙම වර්ෂයේ අයවැය මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් කර වැඩසටහන් සිදු කරමින් පවතින බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුලදී කර්තව්‍යයන් 121ක් සඳහා රු.39,840,000ක ප්‍රතිපාදන සලසා තිබුණද දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන රු.38,270,000ක් වටිනාකම වූ කර්තව්‍යයන් 111ක් අත්හැර දමා තිබුණි. | යෝජනා ක්‍රියාත්මක කිරීමේදී සිදු වූ ප්‍රමාදය මත අදාල කර්තව්‍යන් අතහැර දැමීමට සිදු වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සභාවේ අභ්‍යන්තර විගණනය විසින් අවධානය යොමු කර තිබුණේ සේවක ණය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, නිවාඩු හා ආදායම් පිළිබඳව පමණි. | මෙම වර්ෂයේදී සැලසුමට අදාළව කටයුතු සිදු කරන ලෙසට උපදෙස් දී ඇති බව. | ආයතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟා වීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු 17ක් සඳහා ඉලක්කයන් හඳුනාගෙන තිබූ අතර අරමුණු 10ක් පමණක් ඉටුකර තිබුණි. | අපේක්ෂිත සියලු වැඩසටහන් සම්පූර්ණව ඉටු කිරීමට අවස්ථාවක් නොලැබුණු බව. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අදාළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |